## ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

# 2007 අංක 56 දරණ සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුතියෙහි 3 වන වගන්තියෙහි අන්තර්ගතය පිළිබඳව නීතිමය විශ්ලේෂණය සහ ඒ හා සමගාමික නිර්දේශයන්

ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව 2007 අංක 56 දරණ සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුතියෙහි ( ICCPR පනත) 3 වන වගන්තිය වෛරී අපරාධ මැඩ පැවැත්වීම සඳහා යොදා ගත යුතු වැදගත් නීති රාමුවක් ලෙස සලකයි. 3 වන වගන්තියෙහි අන්තර්ගතය පිළිබඳව ශ්‍රී ලංකාවේ නීති පද්ධතිය තුල නිශ්චිත අවබෝධයක් නොමැති බැවින් එම වගන්තියෙහි අන්තර්ගතය සහ භාවිතය පිළිබඳව පැහැදිලි කර ගැනීම සඳහා කොමිෂන් සභාව විසින් සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුතියෙහි (ICCPR සම්මුතිය) 20 වන වගන්තිය (එනම් ICCPR පනතෙහි 3 වන වගන්තිය මඟින් ශ්‍රී ලංකාවේ බලාත්මක කරන මුල් වගන්තිය) ආශ්‍රිත කතිකාවත අදාළ කරගෙන ඇත.

කොමිෂන් සභාවේ නිරීක්ෂණ පහත පරිදිය:

## 1. <u>20 වන වගන්තියට අදාළ අන්තර්ජාතික නීති රාමුව</u>

ICCPR සම්මුතියෙහි 20 වන වගන්තිය පහත පරිදි වේ:

1. යුද්ධය සඳහා කෙරෙන සෑම ප්‍රචාරයක්ම නීතියෙන් තහනම් කළ යුතු වේ.

2. වෙනස්කමට, වෛරයට හෝ සාහසික ක්‍රියාවලට පෙළඹවන ජාතික, වාර්ගික හෝ ආගමික ද්වේශය පැතිරවීම නීතියෙන් තහනම් කළ යුතු වේ.

### 1.1 <u>අදහස් ප්‍රකාශ කිරීමේ නිදහසෙහි අදාළත්වය</u>

ICCPR සම්මුතියෙහි 20 වන වගන්තිය සහ අදහස් ප්‍රකාශ කිරීමේ නිදහස පිළිගෙන ඇති එහි 19 වන වගන්තිය එකට කියවිය යුතු බව එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කමිටුව (කමිටුව), එනම් සම්මුතිය ක්‍රියාවට නැංවීම පිළිබඳව සොයා බලන ස්වාධීන විශේෂඥ කමිටුව, විසින් හඳුනාගෙන ඇත. උදාහරණයක් ලෙස එම කමිටුවේ අංක 11 දරණ පොදු විවරණය[1] අනුව 20 වන වගන්තිය යටතේ අවශ්‍ය වන තහනම් කිරීමක් 19 වන වගන්තිය මඟින් සහතික කරනු ලබන අදහස් ප්‍රකාශ කිරීමේ නිදහස හා අනුකූල විය යුතුය. එමෙන්ම *රොස් එ. කැනඩාව*[2]

---

[1] General Comment 11, United Nations Human Rights Committee, 29 July 1983.

[2] Communication No. 736/1997, U.N. Doc. CCPR/C/70/D/736/1997 (2000).

ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
නො 14, ආර්.ඒ. ද මැල් මාවත
කොළඹ 04.

හීදීද කමිටුව විසින් 20 වන වගන්තිය යටතේ පනවන තහනමක් 19 වන වගන්තිය යටතේද පැවරිය හැකි විය යුතු බව නිරීක්ෂණය කර ඇත.

### 1.2 20 වන වගන්තිය යටතේ වරදෙහි මූලිකාංග

ICCPR සම්මුතියෙහි 20 (2) වන වගන්තිය සැලකිය යුතු අංග දෙකකින් සමන්විත වන බව කොමිෂන් සභාව නිරීක්ෂණය කරයි:

1. ජාතික, වාර්ගික හෝ ආගමික ද්වේශය පැතිරවීම සහ
2. වෙනස්කමට, වෛරයට හෝ සාහසික ක්‍රියාවලට පෙළඹවීම

20 වන වගන්තිය යටතේ ඇති වරද පළමුවෙන්ම ජාතික, වාර්ගික හෝ ආගමික ද්වේශය පැතිරවීමක් විය යුතුය. එවන් පැතිරවීමක් වෙනස්කමට, වෛරයට හෝ සාහසික ක්‍රියාවලට පෙළඹවීමකින්ද සංයුක්ත විය යුතුය. එම වරදට හසු කර ගැනීම සඳහා ඉහත එක් කොටසක් පමණක් ඔප්පු කිරීම ප්‍රමාණවත් නොවේ.

#### 1.2.1 'පැතිරවීම' සහ 'පෙළඹවීම' ඔප්පු කිරීම

ICCPR සම්මුතිය 'පැතිරවීම' යන්නට අර්ථකතනයක් ලබා දී නොමැත.

ICCPR සම්මුතියෙහි 20 වන වගන්තිය යටතේ පැවරෙන රාජ්‍ය වගකීම පැහැදිලි කරගැනීම සඳහා එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් පිලිබඳ මහ කොමසාරිස් කාර්යාලය විසින් දියත් කරන ලද 'වෙනස්කමට, වෛරයට හෝ සාහසික ක්‍රියාවලට පෙළඹවීමටත් සිදුවන ජාතික, වාර්ගික හෝ ආගමික ද්වේශය පැතිරවීම තහනම් කිරීම' සඳහා වූ විශේෂඥ වැඩමුළු මාලාවකට සහභාගී වූවන් විසින් 20 වන වගන්තියෙහි අන්තර්ගත ආකාරයේ වෛරී පැතිරවීම් හඳුනා ගැනීම සඳහා අංග 6 කින් සමන්විත පරීක්ෂණයක් (threshold test) සම්පාදනය කරන ලදී. මෙම පරීක්‍ෂණය එම ක්‍රියාවලියේ අවසන් ප්‍රතිඵලයක් වන රබාත් ක්‍රියා සැලැස්මෙහි[3] (Rabat Plan of Action)අඩංගු වේ.

එම පරීක්ෂණය පහත පරිදි වේ:

a. සන්දර්භය - පැතිරවීම සිදු වන අවස්ථාවේ පවතින දේශපාලන සහ සමාජීය වාතාවරණය (උදාහරණයක් වශයෙන් වර්තමානයෙහි ගැටුම්කාරී වාතාවරණයක් පවතීද යන්න, ගැටුම්කාරී ඉතිහාසයක් තිබේද යන්න, එසේත් නැත්නම් වෙනස් ලෙස සැලකීමේ දීර්ඝ කාලීන ප්‍රවණතාවයක් තිබීම.

b. Speaker - වෛරය පතුරවන පුද්ගලයාට තම අසන්නන් කෙරෙහි කිසියම් බලපෑමක් ඇති කිරීමට බලයක් තිබේද යන්න (එම පුද්ගලයාගේ මහජන ප්‍රතිරූපය, ඔහු හෝ ඇය රාජ්‍ය නිලධාරියකු වීම හෝ ඊට සමාන තත්වයක සිටීම (උදා: ආගමික නායකයන්)) හෝ අසන්නන් කෙරෙහි බලපෑමක් එල්ල කිරීමේ හැකියාවක් තිබේද යන්න.

   තමන් හොබවන යම් තනතුරක් ප්‍රකාරව ලැබෙන බලයක් හෝ කිසියම් සමාජ තත්වයක් එම පුද්ගලයාට තිබිය යුතුමය යන්න මෙයින් අදහස් නොවේ. යම් පුද්ගලයකුට තම අසන්නන්

[3] United Nations, General Assembly, Report of the United Nations High Commissioner for Human Rights on the expert workshops on the prohibition of incitement to national, racial or religious hatred, A/HRC/22/17/Add.4 (11 January 2013), available from undocs.org.



ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
නො 14, ආර්.ඒ. ද මැල් මාවත,
කොළඹ 04.

තමා වෙත නතු කර ගැනීමට ඇති හැකියාව, යම් පුද්ගලයකුට තම ආකල්ප ඒත්තු ගැන්වීමට ඇති හැකියාව සහ අසන්නන්ගේ මතය වෙනස් කිරීමට ඇති හැකියාව, තම අසන්නන් වෙනස්කමට, වෛරයට හෝ සාහසික ක්‍රියාවලට පෙළඹවීමට තරම් යම් පුද්ගලයකුට ඇති හැකියාව මෙයින් අදහස් වේ. එවන් පුද්ගලයකුගේ සමාජ තත්වය ඔහුගේ හෝ ඇයගේ බලපෑම තහවුරු කර ගැනීම සඳහා උපකාරී විය හැකි වුවද, ප්‍රබල සමාජ තත්වයක් තිබීම පමණක් ඒ සඳහා ප්‍රමාණවත් නොවේ.

c. <u>චේතනාව</u> - කිසියම් පුද්ගලයකු තම ක්‍රියාවන්ගේ ප්‍රතිවිපාකයන් දැනදැනම ස්වේච්ඡාවෙන් වෛරී අදහස් පතුරුවන්නේනම් සහ එවන් ප්‍රතිවිපාකයන් වහාම සිදු වේ යැයි දැනුම ඇත්තේනම් එවන් පුද්ගලයකුට මෙම වරදට අවශ්‍ය චේතනාව තිබේ.

20 වන වගන්තිය යටතේ ජාතික, වාර්ගික හෝ ආගමික ද්වේශය පැතිරවීම වරදක් වන්නේ එය වෙනස්කමට, වෛරයට හෝ සාහසික ක්‍රියාවලට පෙළඹවීමකින්ද සංයුක්ත වන්නේනම් පමණි.

නමුත් සියලුම ආකාරයේ වෙනස්කමට, වෛරයට හෝ සාහසික ක්‍රියාවලට පෙළඹවීම් මෙම වගන්තිය යටතට ගැනෙන්නේ නැත.

"රාබත්" ක්‍රියා සැලැස්මට අනුව එවන් පෙළඹවීමක තීරණාත්මක ලක්ෂණයක් වන්නේ ඒ සඳහා ඇති චේතනාවයි.

ARTICLE 19 නම් වූ මානව හිමිකම් සංවිධානය නිරීක්ෂණය කරන පරිදි, වෙනස්කමට, වෛරයට හෝ සාහසික ක්‍රියාවලට පෙළඹවන තැනැත්තකුගේ තීරණාත්මක ලක්ෂණයක් වන්නේ, ඔවුන් තම අදහස්, විශ්වාසයන් අනෙකා සමඟ බෙදා ගන්නවා පමණක් නොව, එවන් අදහස් සහ විශ්වාසයන් මත පදනම්ව යම් යම් ක්‍රියාවන්වල නිරත වීමටද අනෙක් පුද්ගලයින් පෙළඹවීමයි.[4]

2002 ජූලි 1 වන දින සිට බලාත්මක වන අන්තර්ජාතික අපරාධ අධිකරණය පිලිබඳ රෝම ප්‍රඥප්තියෙහි සඳහන් පරිදි චේතනාවෙහි අන්තර්ගතය පහත පරිදි වේ:

රෝම ප්‍රඥප්තියෙහි 30 (2) වන වගන්තිය:

අ.) යම් කිසි ක්‍රියාවකට අදාලව, පුද්ගලයකු එවන් ක්‍රියාවක නිරත වීමට අදහස් කල බව

ආ.) කිසියම් ප්‍රතිවිපාකයකට අදාලව, පුද්ගලයකු එවන් ප්‍රතිවිපාකයක් ඇති කිරීමට අදහස් කල බව හෝ, එවන් ප්‍රතිවිපාකයක් සාමාන්‍ය සිදුවීම් මාලාවක කොටසක් ලෙස සිදු වේ යැයි දැනුවත් බව.

චේතනාවට වඩා අඩු මානසික අංගයක් (එනම් නොසැලකිලිමත් බව ආදිය) 20 (2) වගන්තිය යටතේ වරදක් සඳහා ප්‍රමාණවත් නොවේ.

[4] ARTICLE 19, 'Prohibiting Incitement to Discrimination, Hostility or Violence', December 2012 available at https://www.article19.org/data/files/medialibrary/3548/ARTICLE-19-policy-on-prohibition-to-incitement.pdf



ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
නො 14, ආර්.ඒ. ද මැල් මාවත,

d. <u>ප්‍රකාශනයේ අන්තර්ගතය සහ සවභාවය</u> - ප්‍රකාශනයේ ප්‍රකෝපකාරී ස්වභාවය, එහි ඉදිරිපත් කර ඇති තර්කයන්, භාවිත කර ඇති ප්‍රකාශන මාධ්‍ය, ප්‍රකාශනයේ ස්වරය ආදීන්.

e. <u>ප්‍රකාශනයෙහි පරිමාණය</u> - ප්‍රකාශනය පොදු ස්ථානයක සිදු වේද, අසන්නන්ගේ ප්‍රමාණය ආදීන්.

f. <u>ආසන්න ලෙස සිදුවිය හැකි හානිය</u> - පෙළඹවීමක් හේතුවෙන් ආසන්නතයේම හානියක් සිදුවේයයි සාධාරණ ලෙස අනුමාන කළ හැකි විය යුතුය.

ARTICLE 19 සංවිධානය නිරීක්ෂණය කරන පරිදි අදහස් ප්‍රකාශ කරන්නාගේ වගකීම තහවුරු කිරීම සඳහා ඔහු/ඇය විසින් පොළඹවන ලද ක්‍රියාවන් අනිවාර්යෙන් සිදු වීම අවශ්‍ය නොවේ:

> "නමුත් පොළඹවන ලද හානිය සිදු වීමේ යම් අවදානමක් පවතින බව හඳුනාගනීමට හැකි විය යුතු වේ. ප්‍රකාශනයේ ඍජු ප්‍රතිඵලයක් ලෙස එහි අසන්නන් වින්දිත කණ්ඩායමකට එරෙහිව වෙනස්කමට, වෛරයට හෝ සාහසික ක්‍රියාවලට පෙළඹවීමේ සාධාරණ සම්භාවිතාවයක් පවතින බව අධිකරණයක් විසින් තීරණය කල යුතු වේ."

## <u>20 වන වගන්තිය යටතට ගැනෙන පෙලඹවීම්වලට උදාහරණ</u>

**ඉහත 1.2.1 කොටසට අනුව ජාතික, වාර්ගික හෝ ආගමික ද්වේශය පැතිරවීම 20 වන වගන්තිය යටතට හසු වන්නේ එවන් ප්‍රකාශන වෙනස්කමට, වෛරයට හෝ සාහසික ක්‍රියාවලට පෙළඹවීමකට හේතු වනවානම් පමණක් වන අතර, එවන් පෙළඹවීමක්ද චේතාන්විතව සිදු නොකෙරේනම් 20වන වගන්තිය යටතට හසු නොවේ.**

**පහත දක්වා ඇත්තේ ජාත්‍යන්තර මානව හිමිකම් පර්ෂද විසින් ලද පැමිණිලි මත පදනම්ව හඳුනාගත් පෙළඹවීම් වලට උදාහරණයන් වේ:**

**1. ජාතිය, වර්ගය,** සහ ආගම මත පදනම් වූ ඍණාත්මක ප්‍රතිරූපයක් නිර්මාණය කිරීම (උදාහරණයක් ලෙස X ආගම අදහන සියලුම පුද්ගලයින් ත්‍රස්තවාදීන් යයි මහජනතාව අතර මතයක් ප්‍රචාරය කිරීම).

2. ආරක්ෂිත කණ්ඩායමකට එනම් කිසියම් ජාතියක්, වර්ගයක්, හෝ ආගමකට අදාළ පුද්ගලයකුට පහර දෙන ලෙස ජනතාව දිරි ගැන්වීම, යොමු කිරීම හෝ උපදෙස් දීම.

3. ආරක්ෂිත කණ්ඩායමකට අයත් ආගමික ස්ථාන, දේපල, හෝ ජීවනෝපායන්ට හානි කරන ලෙස ජනතාව දිරි ගැන්වීම.

4. ප්‍රකාශන මාධ්‍ය (මුද්‍රිත මාධ්‍ය, සමාජ මාධ්‍ය ආදී...) අපයෝජනය හරහා ආරක්ෂිත කණ්ඩායමකට එරෙහිව වෛරී අදහස් ප්‍රචාරය කිරීම.

**5. වෙනස් ලෙස සැලකීම සඳහා මහජනතාව පෙළඹවීම (උදාහරණයක් ලෙස ප්‍රකෝපකාරී තොරතුරු ප්‍රචාරය කිරීම මගින් ආරක්ෂිත කණ්ඩායමකට අයත් පුද්ගලයකු සමග ව්‍යාපාර ගනුදෙනු කිරීම වැළැක්වීම).**

ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
නො 14, ආර්.ඒ. ද මැල් මාවත,
කොළඹ 04.

## 2. ICCPR පනතෙහි 3 වන වගන්තිය පිළිබඳව ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ නිරීක්ෂණ

**2.1** ICCPR පනතෙහි පූර්විකාව මගින් ICCPR සම්මුතියෙහි සඳහන් යම් අයිතීන් ශ්‍රී ලංකාව තුළ බලාත්මක කරන බව දක්වා ඇති බව කොමිෂන් සභාව නිරීක්ෂණය කරයි. ඒ අනුව පනතෙහි 3 වන වගන්තිය සම්මුතියෙහි 20 වන වගන්තිය ශ්‍රී ලංකාව තුළ බලාත්මක කර ඇති බව නිරීක්ෂණය කෙරේ.

**3 වන වගන්තිය යටතේ හඳුනා ගත් අපරාධ -**

**3 (1) වගන්තිය - "කිසි ම තැනැත්තකු විසින් යුද්ධය පැතිරවීම හෝ වෙනස් ලෙස සැලකීමට එදිරිවාදිකම්වලට හෝ ප්‍රචණ්ඩක්‍රියාවලට පෙළඹවීම සඳහා ජාතික, වාර්ගික හෝ ආගමික වෛරය සඳහා පැතිරවීම සිදු නොකළ යුතුය."**

**3 (2)** වගන්තිය - **(1)** වන උපවගන්තියෙහි සඳහන් අපරාධ -

**(a)** සිදු කිරීමට තැත්කරන;
**(b)** සිදු කිරීමට ආධාර අනුබල දෙන; හෝ
**(c)** සිදු කරන බවට තර්ජනය කරන,

සෑම තැනැත්තෙක්ම මෙම පනත යටතේ අපරාධයකට වරදකරු වන්නේය.

**3 වන වගන්තිය යටතේ ක්‍රියා පටිපාටික අවශ්‍යතාවයන්**

**3 (3)** වගන්තිය - මේ වගන්තියේ **(1)**වන උපවගන්තිය හෝ **(2)** වන උපවගන්තිය යටතේ වරදක් සිදු කර ඇති බවට තීරණය කරනු ලබන තැනැත්තෙකු මහාධිකරණය විසින් වරදකරු කරනු ලැබීමේදී, බරපතල වැඩ ඇතිව අවුරුදු **10**කට වැඩි නොවන කාලයක් සඳහා බන්ධනාගාරගත කරනු ලැබේ.

**3 (4)** වගන්තිය - මේ වගන්තිය යටතේ වූ වරදක් සංඥෙය සහ ඇප දිය නොහැකි වරදක් වන අතර එවැනි වරදක් සිදු කර ඇති බවට සැක කරනු ලබන හෝ චෝදනා ලැබ සිටින කිසිම තැනැත්තෙකු, විශේෂ අවස්ථානුගත කරුණුවලදී මහාධිකරණය විසින් හැර, ඇප මත මුදා හරිනු නොලැබිය යුතුය.

2.2 ICCPR පනතෙහි 3 වන වගන්තිය ICCPR සම්මුතියෙහි 20 වන වගන්තියෙහි (1) සහ (2)වන අනු වගන්තීන් ඒකාබද්ධ කිරීමක් බව කොමිෂන් සභාව නිරීක්ෂණය කරයි.

ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
නො 14, ආර්.ඒ. ද මැල් මාවත,
කොළඹ 04.

2.3 ICCPR පනතෙහි 3 වන වගන්තියෙහි (2) වන **උපවගන්තිය** යටතේ එහි (1) වන **උපවගන්තිය** යටතේ ඇති වැරදි සිදු කිරීම සඳහා තැත්කරන; සිදු කිරීමට ආධාර අනුබල දෙන; හෝ සිදු කරන බවට තර්ජනය කිරීමද ආවරණය වන පරිදි සම්මුතියෙහි 20 වන වගන්තිය පුළුල් කර ඇති බව නිරීක්ෂණය කෙරේ.

## 3. <u>ICCPR පනතෙහි 3 වන වගන්තියේ විෂය පථය පිළිබඳව කොමිෂන් සභාවේ නිර්දේශයන්</u>

ඉහත දක්වන ලද කරුණු වලට අනුකූලව කොමිෂන් සභාවේ නිර්දේශයන් පහත පරිදි වේ:

**3.1** ඉහත 2 වන කොටසෙහි නිරීක්ෂණයන්ට අනුව පනතෙහි 3 වන වගන්තිය සම්මුතියෙහි 20 වන වගන්තියට අදාළ අන්තර්ජාතික නීති රාමුවට අනුකූලව අර්ථකථනය කල යුතු බව කොමිෂන් සභාව නිර්දේශ කරනු ලැබේ.

**3.1.1** 3 වන වගන්තියෙහි අන්තර්ගතය තීරණය කිරීම සඳහා රබාත් ක්‍රියා සැලසුමෙහි ඇතුලත්, ඉහත 1.2.1 කොටස යටතේ සාකච්ඡා කරන ලද, අංග 6 කින් සමන්විත පරීක්ෂණය (threshold test) උපයෝගී කර ගත යුතු බව.

**3.1.2** වෛරය පැතිරවීම, වෙනස් ලෙස සැලකීම, එදිරිවාදීකම, සහ ප්‍රචණ්ඩක්‍රියා වලට පෙළඹවීමක් නොවේනම් එවන් ප්‍රකාශන 3 වන වගන්තිය යටතේ තහනම් කිරීමකට ලක් නොවිය යුතු බව.

**3.2** **අදහස් ප්‍රකාශ කිරීමේ** අයිතිය සහ පනතේ 3 වන වගන්තිය තුලිතව ක්‍රියාවට නැංවිය යුතුය:

3.2.1 ICCPR පනතේ 3 වන වගන්තිය ස්වාධීන වගන්තියක් ලෙස හඳුනා ගත නොයුතුය. එය ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් තහවුරු කර ඇති **අදහස් ප්‍රකාශ කිරීමේ** නිදහස සමඟ එකට කියවිය යුතු වේ. ICCPR පනතේ 3 වන වගන්තිය **අදහස් ප්‍රකාශ කිරීමේ** නිදහසට පනවන සීමාවක් වන බැවින් 3 වන වගන්තිය යටතේ පනවා ඇති **අදහස් ප්‍රකාශ කිරීමේ** නිදහසට සිදු කරන තහංචි, **අදහස් ප්‍රකාශ කිරීමේ** නිදහස යටතේ පැනවිය හැකි සීමාවන්ට අනුගත විය යුතුය.

3.2.2 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 14 (1) (අ) වගන්තියෙහි ආරක්ෂාව ලබන **ප්‍රකාශන** **ICCPR** පනතෙහි 3 වන වගන්තිය යටතේ තහනම් කල නොහැක. උදාහරණයක් ලෙස කිසියම් ජාතියක, වාර්ගික හෝ ආගමකට අයත් පුද්ගලයකුට කම්පනයක් ඇති කරවන, අවමානයට පත් කරන හෝ කැළඹීමකට හේතු වන ආකාරයේ ප්‍රකාශණයක් එම කරුණ මත පමණක්ම පදනම්ව 3 වන වගන්තිය යටතේ තහනම් කල නොහැක.

3.2.3 ඒ අනුව 3 වන වගන්තිය යටතේ රජය විසින් පනවන ලද සීමාවක් නීත්‍යානුකූල වීමට නම් එම සීමාව නීත්‍යානුකූල බව, සමානුපාතික බව සහ අවශ්‍යතාවය යන පරීක්ෂණ තුනම සැපිරිය යුතුය. කොටස් තුනකින් සමන්විත මෙම පරීක්ෂණය ශ්‍රී ලංකාවේ නඩු තීන්දු නීති රාමුව තුල මේ වනවිටත් ක්‍රියාත්මකය (*සුනිලා අබේසේකර එ. ආරිය රුබසිංහ, නිසි බලධරයා*)[5].

**3.3** 3 වන වගන්තිය ක්‍රියාත්මක කල හැක්කේ පුද්ගලයන් කිහිපදෙනෙක් එකට එකතු වී ක්‍රියා කරන අවස්ථාවක පමණක් නොවේ. එක් පුද්ගලයකු වුවද, තම ක්‍රියාවන් වල ප්‍රතිඵලයක් ලෙස වෙනස් ලෙස සැලකීම,

[5] (2000) 1 SLR 314



ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
නො 14, ආර්.ඒ. ද මැල් මාවත.

එදිරිවාදීකම්, සහ ප්‍රචණ්ඩක්‍රියා සිදු වේ යයි යන දැනුමෙන් යුතුව එවන් ක්‍රියාවන් සඳහා අනෙක් පුද්ගලයන් පොළඹවන්නේනම්, 3 වන වගන්තිය යටතේ වූ වරදට හසු කර ගත හැක.

**3.4** 3 (3) සහ (4) වගන්තිවලට අනුව යම් පුද්ගලයකු 3 වන වගන්තිය යටතේ වරදක නිරත වන බවට සාම නිලධාරියකු තුල සාධාරණ සැකයක් පවතීනම් එවන් පුද්ගලයකු වරෙන්තුවක් නොමැතිව අත් අඩංගුවට ගැනීමේ හැකියාව එම නිලධාරියා සතුය. එසේ අත් අඩංගුවට ගත් පුද්ගලයකු පොලිස් ඇප හෝ අපේක්ෂිත ඇප මත නිදහස් කිරීමේ හැකියාවක් නොමැත. ඇප ලබා දිය හැක්කේ, සුවිශේෂී අවස්ථාවලදී, මහාධිකරණයක් විසින් පමණි.

**3.5** 3 වන වගන්තිය යටතේ වරදකට හසු වන පුද්ගලයකු වෙනත් වරදක් හුවා දක්වා නිදහස් නොකළ යුතුය. උදාහරණයක් ලෙස ප්‍රචණ්ඩකාරී ක්‍රියාවකට පෙළඹවීමක් සිදු කරන පුද්ගලයකු සාමයට බාධා කිරීම යන වරද යටතේ නිදහස් නොකළ යුතුය.

**3.6** පනත යටතේ වන රාජ්‍ය වගකීම සහ 3 වන වගන්තියෙහි අර්ථකථනය:

**3.6.1** පුද්ගලයින්ගේ අයිතීන් ආරක්ෂා කිරීමට සහ නීතියේ සම රැකවරණය ලබා දීම සඳහා තෙවන පාර්ශවයක් විසින් වෙනස් ලෙස සැලකීම, එදිරිවාදීකම, සහ ප්‍රචණ්ඩක්‍රියා වලට පෙළඹවීමෙන් පුද්ගලයන් ආරක්ෂා කිරීමේ වගකීම රාජ්‍ය සතු වන අතර, එවන් පෙළඹවීම් සිදු කිරීමෙන්ද වැළකී සිටිය යුතුය.

**3.6.2** යම් පුද්ගලයකු 3 වන වගන්තිය යටතේ වරදක නිරත වන බවට සාධාරණ සැකයක් පවතින විට ඒ පිළිබඳව කටයුතු කළ හැකි නිලධාරියකු ICCPR පනත යටතේ වන නීතිමය ප්‍රතිපාදන ක්‍රියාවට නැංවීමට අපොහොසත් වන්නේනම් හෝ මැළි වන්නේ නම් එය වෛරී ප්‍රකාශයන්ට රජය විසින් ලබා දෙන ව්‍යංග අනුබල දීමක් වන අතර, ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12 වන වගන්තිය යටතේ මූලික අයිතිවාසිකම් උල්ලංඝනය කිරීමකට හේතු වන රාජ්‍ය වගකීම් පැහැර හැරීමක්ද වේ.

Dr. N. D. Udagama
Chairperson
Human Rights Commission of Sri Lanka

ආචාර්ය දීපිකා උඩගම,
සභාපතිනී,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

2019.08.29